**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් සඳහා දුන් වට්ටම් රු. 286,242 ක මුදලක් ගිණුම්ගත කිරීමට අදාල ජර්නල් සටහන් යොදා නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ දැන්වීම් පුවරු/ බැනර් ගාස්තු රු.264,200ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.4,935,201ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම් ආධාර රු.675,000ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ව්‍යාපාර බදු රු.155,400ක්ද, කර්මාන්ත බදු රු.1,000ක්ද ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළව තැන්පත් ගිණුමෙහි තැන්පත් කර තිබූ රු.465,012ක රථ කුලියට දීම් ආදායම හා රු.55,750ක ගලි බවුසර් ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂය තුල මිලදීගෙන තිබූ රු.691,900ක ලිබඩු සවිකිරීම් හා යන්ත්‍ර උපකරණ අයිතම 10ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | CAT 2020 මෘදුකාංගය සඳහා මූලික ශේෂය ගෙවීම් ලෙස වයඹ සංවර්ධන අධිකාරිය වෙත 2019 වර්ෂයේ ගෙවා තිබූ රු.270,750ක් හා රු.4,437,667ක පිරිවැයක් දරා ඉදිකර තිබූ කිරිමැටියාන උප කාර්යාලයේ වාහන නැවතුම් අංගනයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (එ) | 2020 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ලිපිද්‍රව්‍ය, වීදි පහන්, උපකරණ යනාදී තොග භෞතිකව ගණනය කර අවශ්‍ය ගැලපීම් සිදුකර එම තොගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඒ) | ප්‍රාදේශීය සභාව වෙත තෑගි ඔප්පු වශයෙන් ලැබී තිබූ ඉඩම් කොටස්වල හා ඉඩම් අනුබෙදීම් කිරීමට අදාළව වෙන්දේසි සමාගම් විසින් පවරා දී තිබූ පොදු ඉඩම් කොටස්වල, වෙළඳ පොල අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පාලනය කරණු ලබන පෙර පාසල් 15 ක් සඳහා 2018 හා 2019 වර්ෂවලදී පෙර පාසල් සංවර්ධන සමිතිය නමින් රු.14,900ක වියදමක් දරා බිල්පොත් 150ක් සභාව මඟින් මුද්‍රණය කරවා තිබුණු අතර 2021 අප්‍රේල් මාසය වන විට අදාල පෙර පාසල් වලට අයත් ළමුන්ගෙන් සභාවේ නම් සඳහන් කුවිතාන්සි මගින් රු.6,821,408ක මුදලක් එකතුකර තිබුණි. විධිමත් අනුමැතියකින් තොරව බැංකු ගිණුම් 15ක් විවෘත කර එම මුදල් තැන්පත් කර එම මුදල් වලින් වියදම් දරා තිබුණු අතර ඊට අදාළ ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර අදාල ගිණුම් කිසිදු විගණනයකට ලක්වී නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලින් රු15,731,976.ක මුදලක් සභාව විසින් පෙර පාසල් වියදම් වෙනුවෙන් දරා තිබුණි. | ව්‍යවස්ථාව අනුව අවශ්‍ය වන ලදුපත් ප්‍රාදේශීය සභාව මගින් පෙර පාසල් වෙත ලබා දී ඇති අතර ඉහත කී ව්‍යවස්ථාවේ 5 (vii) වගන්තියට අනුකූලව සෑම පෙර පාසලකම බැංකු ගිණුමක් විවෘත කර ඇත. ඉදිරියේදී මේ පිළිබඳ කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර, වියදම්වලට අදාළ ගිණුම් සභාවට ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,011,251ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.133,088,555ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | <u>වරිපනම් හා බදු</u><br>සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.16,929,998ක් තුල වෙනත් ආදායම් වර්ග කිහිපයක් ඇතුළත් කර තිබුණි. | ආදායම් ශීර්ෂ වෙන් වෙන්ව දැක්වීමට කටයුතු කරමි. | ආදායම් මාර්ග හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | <u>කුලී</u><br>උපයෝගී ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කුලී රු.5,251,276 ක් විය. | අයකර ගැනීමට හෝ අයකල නොහැකි ශේෂ සම්බන්ධව විකල්ප (නීතිමය) පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ග අඩි 6878 ක්වූ වෙන්නප්පුව පැරණි වෙළඳ සංකීර්ණයේ උඩුමහළ කාමර වෙන්කිරීමකින් තොරව මුළු පරිශ්‍රයම නීත්‍යානුකූලව ටෙන්ඩර් ලබා නොදී, වෙළඳ සමාගම් 03කට අයකිරීමකින් තොරව භාවිතය සඳහා ලබාදී තිබුණි. මේ හේතුවෙන් ආර්ථික වටිනාකමක් ඇති මෙම කඩ කාමරවල ආදායම සභාවට අහිමි වී තිබුණි. | කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා තැන්පත් ගිණුමෙහි රඳවාගැනීම් ලෙස තිබූ රු.5,506,379ක වටිනාකම, අදාළ කර්මාන්තයන්හි ප්‍රගතිය පරීක්ෂා කොට ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |